# අපූරු යාළුකම



W.M. සෙනුකි ගිහංසා වීරවංශ

| | |
|---|---|
| කෘතියේ නම | : අපූරු  යාළුකම |
| කතෘගේ නම | : සෙනුකි ගිහංසා වීරවංශ |
| ශ්‍රේණිය | : 2E |
| කතෘ අයිතිය ඇතුළු විස්තර | : සියලුම හිමිකම් ඇවිරිණි |
| කතෘගේ වෙනත් කෘති | : අකීකරු දරුවන් |
| කෘතිය පල කරන දිනය | : 08 - 02 - 2025 |

ISBN : 978624208359-9

# පිදුම

මාගේ ආදරණීය මහාමායා

මෑණියන්ට මගේ මේ පොත

ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක ලොකු කැලයක් තිබුනා.
ඒ කැලෑවේ මුව පවුලක් ජීවත් වුණා.



ඒ මුව පැටියා හරිම දඟකාරයි. ඌ තනියම කැලේ එහෙ මෙහෙ ඇවිදිනවා. එහෙම ඇවිදින අතරේ එයාට සිංහ පැටියෙක් හම්බ උනා.



එක දවසක මුව අම්මා කෑම සොයන්න කැලයට ගියා.

මුව අම්මා දැක්කා සිංහ පැටියා එක්ක මුව පැටියා සෙල්ලම් කරනවා.

මුව අම්මා බය වෙලා මුව පැටියාව

ගෙදර එක්කන් ගියා.



ආයෙත් දවසක මුව පැටියා කැලේ ඇවිදගෙන ගියා. එහෙම යනකොට දඩයක්කාරයෙක් අටවපු උගුලකට මුව පැටියා හසුවුණා.



අනේ මාව බේරගන්න
අම්මේ" අම්මේ" කියා කෑ ගැසුවා. කාටවත්
ඇහුනේ නෑ.
සිංහ පවුල ඇවිදගෙන යනකොට මුව පැටියා
කෑ ගහනවා ඇහුනා.
සිංහ පැටියා ඉක්මණින් එතනට ආවා



තාත්තේ මේ ඉන්නේ මගේ යාළුවා බේරලා දෙන්නකෝ.

හැබැයි එයාව කන්න එපා. සිංහ පැටියා කිවුවා.

නෑ පුතා මං මුව පැටියා කන්නේ නෑ.


සිංහ තාත්තා කිවුවා.



එයාලා එකතු වෙලා මුව පැටියාව බේරගත්තා.
මුව පැටියා ගොඩක් බයවෙලා හිටියේ.
බය වෙන්නේ නැතුව සෙල්ලම් කරන්න.

සිංහ තාත්තා කිව්වා.

ඉතින් ඊට පස්සේ සිංහ පැටියයි මුව පැටියයි
සතුටින් සෙල්ලම් කලා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

---

# W.M. සෙනුකි ගිහංසා වීරවංශ
# 2 ශ්‍රේණිය E

ISBN : 978624208359-9

---

මිල : රු. 80/-